**කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මාර්ග ඉදිකිරීමේ වියදම් සඳහා වැය කරනු ලැබූ මුදල් පිළිවෙලින් රු.23,143,962 ක් සහ රු.41,367,764 ක් වශයෙන් එකතුව රු.64,511,726 ක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 12 කට පෙර සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මියගිය සේවකයින් 11 දෙනෙකුට ලබාදුන් ණය මුදලෙන් අයකර ගත යුතු රු.369,771 ක් අදාළ පුද්ගලයන්ගෙන් හෝ නැතහොත් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

#### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ)** 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය නිලධාරීන් දෙදෙනෙකුට පරිපාලනමය |

| | | |
|---|---|---|
| | | වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) | X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 18,638,507 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 27,630,462 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,991,955 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ රු.මිලියන 30 අධික අතැති මුදල් ශේෂයක් පැවතුණි. මෙය ආදායම් උපයාගත හැකි ඵලදායි ක්‍රියාවන්වල යෙදවීමෙන් ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීමෙන් සභාව විසින් වර්ෂයකට ආසන්න වශයෙන් රු.මිලියන 3.3 ක ආදායම් අහිමි කරමින් පැවතුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු හිඟ මුදල් රු.15,208,067 ක් අයකර ගැනීමට 2018 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

#### 2.3.2 කඩකුලී හිඟ

පාසිකුඩාහි සභාව විසින් බදු දී තිබුණු ආදූම් මාරු කිරීමේ මධ්‍යස්ථාන I, II සහ වාහන නැවතුම් පොළෙන් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අයකරගත යුතු කඩකුලී හිඟ රු.6,552,700ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1** කාර්යසාධනය

----------------

තිරසාර සංවර්ධන අරමුණු

--------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී ඇදුම් මාරු කිරීමේ මධ්‍යස්ථාන I හා II බදුගත් අය විසින් රු.673,500 ක් ගෙවිය යුතුව තිබියදී බදු හිඟ මුදල් අයකර ගැනීමකින් තොරව නැවත ඔහුටම 2018 වර්ෂයේදීත් ඇදුම් මාරු කිරිමේ මධ්‍යස්ථාන I හා II ලබා දී තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ සංචාරක හෝටල්වලින් එහි මුළු ආදායමින් සියයට 01 ක් බදු වශයෙන් අයකළ යුතු වුවත් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර පාසිකුඩා ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ප්‍රසිද්ධ සංචාරක හෝටල් 14 කින් අයකර ගත යුතු බදු මුදල් විගණන දිනය වන 2018 මැයි 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ සභා බල ප්‍රදේශයට අයත් රෝහලේ ඉපදුනු ළදරුවන් 1,895 කින් ළදරුවන් 261 ක් අඩු බර ළදරුවන් වශයෙන් ඉපදී තිබුණි. එසේ වුවත්, සභාව විසින් අයවැය ඇස්තමේන්තුවෙන් රු.50,000 ක් මව් දරු සුභසාධනය සහ සෞභාග්‍යය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණත්, සභාව විසින් රු.30,450 ක් මව් දරු සුභසාධනය සහ සෞභාග්‍ය සුභසාධන වැඩසටහන සඳහා වැය නොකර ඩෙංගු මර්ධනය වෙනුවෙන් වැයකර තිබුණි. තවද, 2016 වර්ෂයේදී ද ඉහත රෝහලේ ඉපදුනු ළදරුවන් 1,308 කින් ළදරුවන් 166 ක් අඩු බර ළදරුවන් වශයෙන් ඉපදී තිබුණි. එසේ වුවත්, අයවැය ඇස්තමේන්තුවෙන් මව් ළදරු සුභසාධනය හා සෞභාග්‍ය උදෙසා රු.150,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණත්, සභාව විසින් රු.63,850 ක් මව් හා ළදරු සුභසාධනය හා සෞභාග්‍ය වැඩසටහන සඳහා වැය නොකර වෙනත් වැඩසටහන් අධීක්ෂණ කටයුතු සඳහා වැයකර තිබුණි.

(ඈ) සභාවට අයත් ඉඩමේ නව වෙළඳ පොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.6,290,000 ක වටිනාකමට 2016 ඔක්තෝබර් 15 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේවුවත් කොන්ත්‍රාත්කරු විසින් එම ඉඩමේ රු.924,053 ක් පිරිවැය වූ ඉදිකිරීම් කටයුතු නිම කළ පසු අදාළ ඉඩම, ප්‍රදේශයේ වෙනත් අයෙකුට අයත් බව අයිතිවාසිකම් කීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් අතහැර දමා තිබුණි. එසේ වුවත්, එම ඉඩමේ අයිතිය තහවුරු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඉඩම පවරගෙන ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව විසින් සභාවට අයත් ඉඩම් හඳුනාගෙන ඒවා සලකුණු කිරීම් සිදු කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේ හෝ පසුගිය වර්ෂයේ හෝ කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, තාවකාලික/ අනියම් හා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ අනුමැතියද ලබා ගැනීමෙන් පසුව පමණක් සේවකයින් අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත යුතු වුවත්, මෙයට පටහැනිව පූර්ව අනුමැතිය හා අවසරය ලබා නොගෙන 2015 වර්ෂයේදී සේවකයින් 15 දෙනෙකුත්, 2017 වර්ෂයේදී සේවකයින් 48 දෙනෙකුත් වශයෙන් මුළු සේවකයින් 63 දෙනෙකු අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අනියම්/ තාවකාලික පදනමින් බඳවා ගනු ලබන සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සේවකයන්ගෙන් 8% ක දායකත්ව මුදල් අයකර ඒ සමඟ පළාත් පාලන ආයතනයේ දායකත්වය වන 12% ප්‍රතිශතය එකතු කර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතුය. එසේ වුවත්, ඉහත වර්ෂවලදී බඳවා ගනු ලැබූ සේවකයන් 63 දෙනෙකු සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකත්ව මුදල් යවා නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------

මාර්ගවලට බොරළු දැමීම
-------------------------------

2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභාවේ චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව, මූලධන ප්‍රතිපාදනවලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන සභා මාර්ග ඉදිකිරීමේදී බොරළු දැමීම හා තාවකාලික මාර්ග ඉදිකිරීම වැනි කාර්යයන් නවතා දීර්ඝ කාලයක් භාවිතා කළ හැකි අයුරින් කාපට් දැමීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් දැමීම සිදු කළ යුතු බවට සඳහන් කර තිබූ නමුත්, එයට පටහැනි අයුරින් සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග 03 කට රු.5,181,000 ක වියදමින් බොරළු දමා තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
-------------------------------------------

4.1 **නිරවුල් නොකළ විගණන ඡේද**
-----------------------------------

සභාවේ විශේෂ කොමසාරිස්වරයාට පරිත්‍යාගශීලියකු විසින් 1980 ජූලි 06 දිනැති අංක 4772 දරන හිමිකම් ඔප්පුව යටතේ පරිත්‍යාග කරනු ලැබූ පර්චස් 14 ක ඉඩම පවරාගෙන නඩත්තු කිරීම පැහැර හැරීම හේතුවෙන් පෞද්ගලික පාර්ශව විසින් එම ඉඩම ආක්‍රමණය කර භාවිතා කරමින් පැවතුණි. මේ පිළිබඳව පසුගිය වර්ෂයේ අපගේ වාර්තාවේ අනාවරණය කරනු ලැබූ නමුත් සභාව විසින් මේ දක්වා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) කොන්ත්‍රාත් පරිපාලනය | මාර්ග ඉදිකිරීමේදී අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභාවේ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කිරීම |
| (ඇ) වත්කම් | සභාව සතු ඉඩම් හඳුනාගෙන ඒවා සලකුණු කිරීමට කටයුතු කිරීම |